**ජාතික පර්යේෂණ සභාව - 2013**

---------------------------------------

ජාතික පර්යේෂණ සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 හා 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ජනාධිපති සම්මාන උළෙල සඳහා ලබාදුන් රු. 75,000 ක අත්තිකාරම් මුදල අත්තිකාරම් ලෙස සටහන් කිරීම වෙනුවට මුදල් හා මුදල් සමාන දෑ හි අඩංගු කර තිබුණි.

**2.2.2 ලැබිය යුතු ගිණුම්**

2012 ජුනි දක්වා පර්යේෂණ සභාව පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල වෙනුවෙන් තැන්පත් කරන ලද රු. 90,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණ විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| II පරිච්ඡේදයේ 12.5.4 ඡේදය සහ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද ඊට පටහැනිව ජාතික පර්යේෂණ සභාවේ ලේකම් තනතුර සඳහා 1999 වර්ෂයේ සිට ද ගණකාධිකාරී තනතුර සඳහා 2003 වර්ෂයේ සිට ද වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි. |

| | |
|---|---|
| | වැඩ බැලීමේ පත්වීමක් සඳහා ගෙවිය යුතු දීමනාව මූලික වැටුපෙන් සියයට 25 නොඉක්මවිය යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා රු.303,756 ක් වූ වැටුප් ලේකම් තනතුරේ හා සමාලෝචිත වර්ෂයේදී රු.90,900 ක වැටුප් ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 29 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.201,871,941 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 9.2 වගන්තිය | ආයතනයේ සංවිධාන සටහන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 9.3.1 වගන්තිය | පර්යේෂණ සභාව පිහිටුවා අවුරුදු 06 කට අධික කාලයක් ගත වී ඇතත් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2012 අගෝස්තු 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ Dms/1765 දරන ලිපිය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කාර්ය පැවරුම් පදනම මත නිලධාරීන් 6 දෙනෙකු අනුමැතිය ලබා ගැනීමෙන් තොරව බඳවා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු. 911,390 ක දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පර්යේෂණ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,357,760 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.443,022 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,800,782 ක පිරිහීමක් දක්නට ලැබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා කාර්ය මණ්ඩල වියදම් රු.2,000,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ජංගම වත්කම් වලින් සියයට 99 ක් පර්යේෂණ ප්‍රදාන වෙනුවෙන් බැංකු ජංගම ගිණුම් වල තැන්පත් කර ඇති මුදල් වලින් නියෝජනය කෙරේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) 2006 – 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ 247 ක් සඳහා රු. 919,000,000 ක මුදලක් ප්‍රදානය කර තිබූ අතර ඉන් පර්යේෂණ ප්‍රදාන 39 ක් සඳහා විද්‍යා නාමකරණ දර්ශක (Science Citation Index) ප්‍රකාශන හා පර්යේෂණ 47 ක් සඳහා වෙනත් ජාත්‍යන්තර ප්‍රකාශන සිදු කර තිබුණි. එසේම පර්යේෂණ 19 ක් අතහැර දමා තිබූ අතර නිමකල පර්යේෂණ 74 ක් සඳහා පමණක් පේටන්ට් අයිතිය ලබාගෙන තිබුණි.

(ඇ) වර්ෂ 03 ක කාලසීමාව තුළ භාණ්ඩාගාර ප්‍රතිපාදන වැයකර සිදුකල පර්යේෂණවල අවසන් ප්‍රතිඵලය පර්යේෂණ ප්‍රකාශනයකට සීමා වී තිබූ අතර, පර්යේෂණ ප්‍රතිඵල භාවිතයට නොගැනීමත්, පේටන්ට් අයිතිය ලබා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා පර්යේෂණ සඳහා ලබාදෙන මුදලට නිසි අගයක් නොලැබෙන බව නිරීක්ෂණය විය.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති 60 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 273,000,000 ක ප්‍රතිපාදන සැලසුම් කළද, සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණේ පර්යේෂණ 41 ක් සඳහා රු. 217,000,000 ක් පමණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විද්‍යා නාමකරණ දර්ශකයේ (SCI) ප්‍රකාශන සිදුකළ පර්යේෂණයන් 350 කට සම්මාන ප්‍රදානයන් කිරීමට සැලසුම් කළද, වර්ෂය තුළදී එකදු සම්මානයක් හෝ ලබාදී නොතිබුණි.

(ඊ) පශ්චාත් උපාධි අපේක්ෂකයින් 60 දෙනෙකු ලියාපදිංචි කරවීමට සැලසුම් කළද, උපාධි අපේක්ෂකයින් 36 දෙනෙකු පමණක් ලියාපදිංචි කර තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයට පෙර ජනාධිපති කාර්යාලය යටතේ පර්යේෂණායතනයක් ලෙස පැවති ජාතික පර්යේෂණ සභාව, 2007 සැප්තැම්බර් 15 දිනැති අංක, 1514/28 දරන අති විශේෂ ගැසට්පත්‍රය මඟින් ජනාධිපති විශේෂ විධිවිධාන යටතේ පිහිටුවා ඇත. ජනාධිපති විශේෂ විධිවිධානයේ දක්වා ඇති පරිදි ව්‍යවස්ථාවක් මඟින් පර්යේෂණ සභාවක් පිහිටුවන තුරු මෙම ආයතනය පිහිටුවා තිබුණ ද, 2013 වර්ෂය අවසාන වන විට ද ව්‍යවස්ථාවක් සකස් කර ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පර්යේෂණ සභාව පිහිටු වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ගිවිසුමේ 06 පරිච්ඡේදය අනුව අවසන් වූ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම්/ උපකරණ නැවත ජාතික පර්යේෂණ සභාව වෙත පවරා ගැනීම හෝ අදාළ පර්යේෂණ ආයතනයට පැවරීම හෝ වෙනත් පර්යේෂණ ව්‍යාපෘතියකට මාරු කිරීම කළ යුතු වුවත් 2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ අවසන් කර තිබූ ව්‍යාපෘති 06 කට අදාළව රු. 13,233,927 ක් වූ වත්කම් හා උපකරණ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව පවරාදීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පවරා දුන් රු.100,819,092 ක් වූ වත්කම් විධිමත් පරිදි පවරාදීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමෙන් පසු පර්යේෂණ 11 ක් සම්බන්දයෙන් ඉදිරිපත් කරන ලද අවසාන වාර්තා වසර 1 සිට වසර 4 දක්වා ගත වී තිබුණ ද අදාළ ඇගැයීම් කටයුතු 2013 දෙසැම්බර් 31 දින වනවිටද සිදුකර නොතිබුණි.

(ඇ) 2007, 2008 හා 2009 වර්ෂ සඳහා ජනාධිපති සම්මාන උළෙල 2011 වර්ෂයේ දී පැවැත්වීම සඳහා සැලසුම්කර අයදුම්පත් කැඳවීම සිදුකර තිබුණ ද සම්මාන උළෙල පවත්වා නොතිබුණි. මේ සඳහා 2011, 2012 හා 2013 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළිවෙලින් රු. 1,550,000, රු. 2,730,000 හා රු. 1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සම්මාන උළෙල පවත්වන ලද්දේ 2014 වර්ෂයේදීය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පර්යේෂණ සභාව මගින් තෝරාගනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමේ දී, පර්යේෂණ ආරම්භ කරන අවස්ථාවේදීම අවුරුදු 03 ක් වැනි කාලපරිච්ඡේදයකට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඒ ඒ ව්‍යාපෘතිය යටතේ ජංගම ගිණුම්වලට බැර කරනු ලබන අතර පසුගිය වර්ෂ කිහිපයක බැංකු ජංගම ගිණුම් ශේෂයන් පරීක්ෂා කිරීමේ දී ජංගම ගිණුම්වල පහත සඳහන් පරිදි අඛණ්ඩව අධික මුදලක් නිෂ්ක්‍රීයව තිබූ බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ජංගම ගිණුම්වලට බැරකල ප්‍රතිපාදිත මුදල | බැංකු ජංගම ගිණුම්වල වර්ෂය අවසානයේ ඉතිරි මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 200,000,000 | 268,113,399 |
| 2012 | 220,000,000 | 346,873,287 |
| 2013 | 217,000,000 | 396,340,514 |

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් කළ ව්‍යාපෘති 18 ක් සඳහා ලබාදුන් ප්‍රතිපාදන මුදලින් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් නොවී ඉතිරිව තිබූ බව ජංගම ගිණුම් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබූ අතර එම ප්‍රතිපාදන ද දීර්ඝ කාලපරිච්ඡේදයක් බැංකු ගිණුම්වල අක්‍රීයව තිබුණි. ඒ අනුව රු. 23,736,730 ක මුදල් ප්‍රමාණයක් 2009 සිට 2013 දක්වා අවුරුදු 03 කට අධික කාලපරිච්ඡේදයක් තුල නිෂ්ක්‍රීයව බැංකු ජංගම ගිණුම්වල අක්‍රීයව තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ පිළිබඳව කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 03 ක් වූ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ දී ව්‍යාපෘතියට අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍ය කඩිනමින් මිලදී ගෙන පර්යේෂණ කටයුතු අදාළ කාලපරිච්ඡේදය තුළ දී නිමකල යුතු වුව ද ව්‍යාපෘති කාලසීමාව අවසන් වී 2012 වර්ෂයේ දී ව්‍යාපෘති ජංගම ගිණුම් වසා තිබූ 08-29 ව්‍යාපෘතිය සඳහා ජාතික පර්යේෂණ සභාවේ බැංකු ගිණුමෙන් 2013 වර්ෂයේ දී රු. 217,785 ක රසායන ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

(ඈ) ව්‍යාපෘති ගිවිසුමේ 8(1) හා (11) ඡේදය අනුව අත්හැර දැමූ හා නිම නොකල ව්‍යාපෘති සම්බන්ධව බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසා දැමිය යුතු අතර එම ගිණුම්වල ඉතිරි මුදල් කඩිනමින් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එහෙත් එකතුව රු. 38,659,069 ක පර්යේෂණ ප්‍රදාන ලබාගත් පර්යේෂකයන් 18 දෙනෙකුගේ ව්‍යාපෘති අතරමග නවතා දමා තිබුණ ද, එම බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසා දමා ඉතිරි මුදල් ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) සමාලෝචිත වර්ෂයේ දී පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා ජාතික පර්යේෂණ සභාව හා පෞද්ගලික අංශය සියයට 50 බැගින් දායක වීම මත "රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේ හවුල්කාරික වැඩසටහන" සඳහා ව්‍යාපෘති 04 ක් යටතේ පෞද්ගලික සමාගම් 04 ක් සමග ගිවිසුම් වලට එළඹ තිබුණි. ව්‍යාපෘති කාල සීමාව අවුරුදු 03 ක් වන අතර ව්‍යාපෘති ආරම්භක දිනය වූ 2013 මැයි 17 දින ව්‍යාපෘති 04 සඳහා ජාතික පර්යේෂණ සභාවේ දායක මුදල වූ රු. 45,798,008 ක් එකවර ජංගම ගිණුමකට බැරකර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගතිය සලකා බලා ප්‍රතිපාදන වරින් වර මුදාහරිනු වෙනුවට රුපියල් මිලියන 45 කට අධික මුදලක් එකවර මුදා හැරීමෙන් රජයේ මුදල් අක්‍රීයව ජංගම ගිණුම්වල රඳවා තිබෙන බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘති බැංකු ජංගම ගිණුම් පරීක්ෂාවේ දී 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.41,948,125 ක් වූ අතර, එක් ව්‍යාපෘතියක් (12-18 ව්‍යාපෘතිය) සඳහා උපකරණයක් මිලදී ගැනීමට 2013 දෙසැම්බර් 18 දින ණයවර ලිපියක් විවෘත කිරීම හැරුනු විට ව්‍යාපෘති 04 වෙනුවෙන් වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

(iii) ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දින වන විට අදාළ පෞද්ගලික සමාගම් 04 ද දායක මුදල් ලෙස එකතුව රු. 23,465,600 ක් බැංකු ගත කළ යුතු වුවද බැංකු ගතකර තිබුණේ රු. 3,937,588 ක් පමණි.

(iv) ගිවිසුමේ II පරිච්ඡේදය අනුව මාස 06 කට වරක් පෞද්ගලික සමාගම් විසින් හය මාසික ප්‍රගති වාර්තා ජාතික පර්යේෂණ සභාව වෙත ඉදිරිපත් කල යුතු වුව ද ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(v) ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.78,370,921 ක මුදලින් රු.32,572,913 ක මුදලක් උක්ත ව්‍යාපෘතියේ අරමුණු වෙනුවෙන් නොයොදවා පර්යේෂණ සභාවේ වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සභාවේ ලේකම් තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කල මාසික වැටුප රු. 38,530 ක් වුව ද ඒ සඳහා නිලධාරියෙකු බඳවා නොගෙන මූලික අධ්‍යයන ආයතනයෙන් මුදාහල නිලධාරිනියක් ලේකම් තනතුරේ යෙදවීම නිසා මාසිකව රු. 73,367 බැගින් දීමනා ගෙවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු. 243,860 ක අතිරේක මුදලක් පර්යේෂණ සභාවට දැරීමට සිදු වී තිබුණි.

(ආ) පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා මිලදීගත් උපකරණයක් ක්‍රියාවිරහිත වීම නිසා එම උපකරණය 2009 ජුලි මස නැවත මිලදී ගත් ආයතනයට භාර දී තිබූ අතර ඒ වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතුව තිබූ මුදල වූ රු. 150,869 ක් පාලක සභා අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබූ අතර උපකරණය සඳහා ගෙවූ එකතු කළ අගය මත බදු මුදල වූ රු.159,000 ක් පෙර වර්ෂයේදී ගිණුම්වලින් ලියාහැර තිබුණි.

**4.5 අරමුණු වලට පටහැනි වියදම්**

**----------------------------------**

2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව දැනුම හා විද්‍යාව පදනම කරගෙන පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම ජාතික පර්යේෂණ සභාවේ මූලික අරමුණ වුව ද එයට පරිබාහිර වූ අවස්ථා 2 ක් සඳහා රු.1,250,00 ක් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 9 ක් පැවතුණි.

(ආ) ජාතික පර්යේෂණ සභාවේ ඉහළ ජ්‍යෝෂ්ඨ කළමනාකරණ හා විධායක තනතුර වූ ලේකම් තනතුර 1999 වර්ෂයේ සිට ද, ගණකාධිකාරි තනතුර 2003 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා 2006 වර්ෂයේ සිට කාර්ය පැවරුම් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර එම නිලධාරීන් ස්ථිර තත්ත්වයට පත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කටයුතු කර නොතිබුණි.

**4.7 අසාර්ථක ව්‍යාපෘති**

---

එකතුව රු. 15,682,293 ක් වැයකර නිමකල පර්යේෂණ ව්‍යාපෘති 07 කට අදාළව පර්යේෂණ වාර්තා ඇගැයීමෙන් පසුව එම ව්‍යාපෘති අසාර්ථක ව්‍යාපෘති/ අසතුටුදායක ව්‍යාපෘති ලෙස දක්වා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම**

---

2011 වර්ෂයේ දී එකතුව රු. 32,290,822 ක් වටිනා උපකරණ 04 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව මිලදීගෙන තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

---

අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබූ අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අදාල අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ ද සහාය ලබාගෙන නොතිබුණි.

**5.3 අයවැය ලේඛන පරීක්ෂාව**

---

2013 දෙසැම්බර් 31 දිනට අයවැයගත වියදම් ඉක්මවා තථ්‍ය වියදම් සියයට 13 සිට සියයට 82 දක්වා වැඩි වී තිබූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයන් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

---

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පර්යේෂණ ප්‍රදාන

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගිණුම්කරණ

(ඈ) අයවැය පාලනය

(ඉ) ව්‍යාපෘති කළමනාකරණය